# කෘෂි විද්‍යාඥයා සන්ෂෝ කෑගලු දිසා ආණ්ඩුකාරයා වෙයි

ප්‍රවීණ කෘෂි හා සමාජ විද්‍යාඥයකු වන එස්. බී. ආර්. නිකහැටිය මහතා ශ්‍රී ලංකා එක්සත් ජාතීන්ගේ මිත්‍රත්ව සංවිධානයේ



සේවාවන් දීපව්‍යාප්ත කිරීමේ වැඩපිළිවෙළ යටතේ සන්ෂෝ කෑගල්ල දිසාආණ්ඩු කාරවරයා වශයෙන් පත්කර ඇත.

නිකහැටිය මහතා පේරාදෙණිය විශ්ව විද්‍යාලයයේ කෘෂිකර්මය පිළිබඳ උපාධියද, එංගලන්තය, නෙදර්ලන්තය හා හවායි යන රටවල කෘෂි පශ්චාත් උපාධියද ලබාගෙන ඇති අතර ගැම්බියාවේ කෘෂි සංවර්ධන ජාත්‍යන්තර අරමුදලේ උපදේශකවරයකු වශයෙන්ද සේවය කර ඇත. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේද, වර්ල්ඩ් වීව් ජාත්‍යන්තර ආයතනයේද සේවය කර ඇති ඒ මහතා දනට ක්‍රිස්තියානි ළමා අරමුදලේ ජාතික අධ්‍යක්ෂවරයා වශයෙන්ද කටයුතු කරයි.

එක්සත් ජාතීන්ගේ මිත්‍රත්ව සංවිධානය, කෑගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන, වාරියපොල, ගල්ගමුව, කෑගල්ල, මාවනැල්ල, අරනායක, යටියන්තොට, රුවන්වැල්ල, දෙහිඕවිට, දරණියගල යන ප්‍රාදේශීය කොට්ඨාශවල ප්‍රාදේශීය ශාඛාවන් 10 ක් ඇතිකිරීමට කටයුතු යොද ඇතැයි නිකහැටිය මහතා කියයි. ඒ සඳහා සම්බන්ධ වීමට කැමැති නායකත්ව ගුණාංග සහිත සමාජ සේවාවන්ට ලැදි අයට සන්ෂෝ දිසා ආණ්ඩුකාර අංක 30, ඩී ලසාල් මාවත කොළඹ 15 යන ලිපිනයට ලියා දන්වන ලෙස ඉල්ලීම් කරයි.